## ලුණුගල ප්‍රාදේශීය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2011 අප්‍රේල් 01 දින ස්ථාපනය කරනු ලැබූ සභාවේ 2011 අප්‍රේල් 01 දින සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජූනි 25 වන දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

#### 2.1 ආදායම් පරිපාලනය

##### 2.1.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

##### 2.1.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 835,740 |
| (ii) | මුද්දර ගාස්තු | 137,105 |

##### 2.1.3 කඩ කුලී

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ පළමු හා දෙවන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාව සතු කඩ කාමර 10 ක් වෙනුවෙන් මාසික බදු කුලිය ප්‍රධාන තක්සේරුකරු මගින් හෝ පළාත් පාලන සේවයේ තක්සේරු කරුවකු මගින් තක්සේරු කර ගෙන නොතිබුණි.

#### 2.2 අධිමත් ගනුදෙනු

ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:5:2 වගන්තියේ විධිවිධානවලට පටහැනිව සභාවේ වැඩ බලන ලේකම්වරයාට 2011 අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා වැඩ බැලීමේ වැටුප ලෙස රු.40,335 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.